රුහුණ විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය - ආර්ථිකවිද්‍යා අධ්‍යයනාංශය

ආර්ථිකවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව-2021/2022

පළමු සමාසික අවසාන පරීක්ෂණය - 2023 මාර්තු

## MAE5100 - සූක්ෂම ආර්ථිකවිද්‍යා න්‍යාය

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න. කාලය පැය (03) තුනයි

**ගණක යන්ත්‍ර භාවිතයට අවසර ඇත.**

---

01.

a) පහත දැක්වෙන්නේ ‘X” භාණ්ඩය සම්බන්ධයෙන් වෙළෙඳ පොළෙහි නිරීක්ෂිත දත්ත වේ.

| ‘X” හි මිළ රුපියල් | ‘X” හි ඉල්ලුම් ප්‍රමාණය කි:ග්‍රෑ: | ‘X” හි සැපයුම් ප්‍රමාණය කි:ග්‍රෑ: |
|---|---|---|
| 07 | 339 | 04 |
| 05 | 345 | 00 |

I. ‘X” භාණ්ඩය සඳහා පවතින ඉල්ලුම් සමීකරණය හා සැපයුම් සමීකරණය (රේඛීය යැයි උපකල්පනය කරමින්) ඇස්තමේන්තු කරන්න. (ලකුණු 02)

II. ‘X” භාණ්ඩයේ සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 02)

III. සමතුලිත මිලේදි ‘X” භාණ්ඩයේ ඉල්ලුම් නම්‍යතාවය හා සැපයුම් නම්‍යතාවය ගණනය කරන්න. (ලකුණු 02)

IV. මෙම භාණ්ඩය මත රජය රුපියල් 12.00 ඒකක බද්දක් පැනවුයේ නම් බද්දට පසු නව සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 02)

V. මෙම බද්දෙන් පාරාභෝගිකයා ගෙවන ප්‍රතිශතය ගණනය කරන්න. (ලකුණු 02)

VI. බද්ද නිසා ආර්ථිකයට අහිමිවන සුභසාධනය ගණනය කරන්න.

(ලකුණු 01)

VII. මෙම භාණ්ඩය මත රජය බද්දක් නොව රුපියල් 08.00 ක සහනාධාරයක් ලබාදුන්නේනම් නම් සහනාධාරයට පසු නව සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය ගණනය කරන්න.

(ලකුණු 02)

VIII. සහනාධාරය නිසා ආර්ථිකයට අහිමිවන සුභසාධනය ගණනය කරන්න.

(ලකුණු 02)

02.

I. නිෂ්පාදන ශ්‍රිතයක් යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 02)

II. කෙටිකාලින නිෂ්පාදන ශ්‍රිතයක් හා දිගුකාලින නිෂ්පාදන ශ්‍රිතයක් අතර පවතින වෙනස්කම පැහැදිලි කරන්න.

(ලකුණු 02)

III. සම නිෂ්පාදන වක්‍ර සිතියමක් යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 02)

IV. පහත සඳහන් කොබ්-ඩග්ලස් නිෂ්පාදන ශ්‍රිතය සැලකිල්ලට ගන්න.

$$Q = 16L^{0.4}K^{0.6}$$

ශ්‍රමයේ මිල $P_L =$ රු: 15.00 හා ප්‍රාග්ධනයේ මිල $P_K =$ රු: 20.00 කි.

a) ශ්‍රමයේ ආන්තික ඵලදා ශ්‍රිතය ව්‍යුත්පන්න කරන්න.

(ලකුණු 01)

b) ප්‍රාග්ධනයේ ආන්තික ඵලදා ශ්‍රිතය ව්‍යුත්පන්න කරන්න.

(ලකුණු 01)

c) ශ්‍රමයේ සාමාන්‍ය ඵලදා ශ්‍රිතය ව්‍යුත්පන්න කරන්න.

(ලකුණු 01)

d) ප්‍රාග්ධනයේ සාමාන්‍ය ඵලදා ශ්‍රිතය ව්‍යුත්පන්න කරන්න.

(ලකුණු 01)

e) ප්‍රසාරණ මාර්ගයේ සමීකරණය ව්‍යුත්පන්න කරන්න.

(ලකුණු 02)

f) ආයතනය ශ්‍රම ඒකක 60 ක් හා ප්‍රාග්ධන කක 50 ක් යොදාගනිමින් නිෂ්පාදන කිරිම කාර්යක්ෂම යෙදවුම් සංයෝගයක් ද ?

(ලකුණු 01)

g) පරිමානානුකූල ඵල සොයන්න.

(ලකුණු 02)

03.

I. පූර්ණ තරඟකාරි වෙලෙඳ පොළක් යනු කුමක් ද ?

(ලකුණු 02 )

II. පූර්ණ තරඟකාරි ආයතනයක ඉල්ලුම් වක්‍රය හා ඒකාධිකාරි ආයතනයක ඉල්ලුම් වක්‍රය එක හා සමාන නොවේ. එම ආයතනයන්හි ඉල්ලුම් වක්‍රයන්හි ස්වරූපය හා ඊට අදාලවන හේතු ඉදිරිපත් කරමින් ඉහත ප්‍රකාශය සනාථ කරන්න.

(ලකුණු 03)

III. පූර්ණ තරඟකාරි ආයතනයක් කෙටි කාලයේදි අලාභ ලැබුවත් තවදුරටත් නිෂ්පාදනයේ නිරතවිය හැකිය. ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේද ? නැද්ද? යන්න හේතු ඉදිරිපත් කරමින් සනාථ කරන්න.

(ලකුණු 02)

IV. පූර්ණ X භාණ්ඩය නිපදවන සමාගමක් ක්‍රියාත්මක වන්නේ පූර්ණ තරඟකාරි වෙළඳපොලක ය. සමාගමේ කෙටි කාලීන පිරිවැය මුළු පිරිවැය වන්නේ

$TC = \frac{Q^2}{4} + 3Q + 400.$ වේ.

$\frac{d}{dQ}AC = 0,$ වන විට,

ආන්තික පිරිවැය සහ සාමාන්‍ය පිරිවැය සමාන බව පෙන්වන්න. (ලකුණු 04 )

V. නිෂ්පාදකයෙකුට යම් නිෂ්පාදනයක එක් ඒකකයක රුපියල් 10/= කට අලෙවි කළ හැකිය. මුළු පිරිවැය $TC = Q^2 + 4Q + 2$ කි.

a) ආයතනයේ ලාභ උපරිම කරන නිමවුම ගණනය කරන්න.

(ලකුණු 02)

b) ආයතනයේ උපරිම ලාභය ගණනය කරන්න.

(ලකුණු 01)

c) ආයතනයේ ලාභ උපරිම කරන අවස්ථාවේදී සාමාන්‍ය අයභාරය හා සාමාන්‍ය පිරිවැය ගණනය කරන්න.

(ලකුණු 01)

04.

I. ඒකාධිකාරී වෙළඳපොලක් යනු කුමක් ද?

(ලකුණු 02)

II. ඒකාධිකාරයෙක් වෙළඳ පොලවල් දෙකක විවිධ මිල ගණන් අය කර භාණ්ඩයක් විකිණීමේදී, එනම් මිල විශේෂිකරණය කෙරේ. A වෙලදපොලේදී ඉල්ලුම් ශ්‍රිතය වන්නේ

A ඉල්ලුම් ශ්‍රිතය වන්නේ

$P_A = 150 - 2Q_A$ වන අතර

B වෙලදපොලේ ඉල්ලුම් ශ්‍රිතය

$P_B = 142 - 2Q_B$ වේ.

මෙහි $Q_A$ සහ $Q_B$ යනු A සහ B වෙලදපොල්වලදි සතියකට අලෙවි කරන ප්‍රමාණයන් වන අතර, $P_A$ සහ $P_B$ එම භාණ්ඩ ඒකකයක අදාළ මිල වේ. ඒකාධිකාරියාගේගේ මුළු පිරිවැය ශ්‍රිතය

TC= 600+6Q.

මෙහි $Q=Q_A+Q_B$.

a) ලාභය උපරිම කිරීම සඳහා එක් එක් වෙළඳපොලේ කොපමණ ප්‍රමාණ අලෙවිකල යුතු ද?

(ලකුණු 03)

b) මෙම උපරිම ලාභය ලබා දෙන විකුණුම් මිලයන් මොනවා ද?

(ලකුණු 02)

c) මිල විශේෂිකරණය නොමැතිව ලාභය උපරිම කිරීම සඳහා ඒකාධිකාරිය කුමන මිලක් අය කරන්නේ ද?

(ලකුණු 03)

d) මිල විශේෂිකරණය හා මිල විශේෂිකරණය නොමැතිව ලාභ වෙනස සංසන්දනය කරන්න.

(ලකුණු 02)

III. X භාණ්ඩය නිපදවන සමාගමක් ක්‍රියාත්මක වන්නේ පූර්ණ තරඟකාරී වෙළඳපොලක ය. සමාගමේ කෙටි කාලීන පිරිවැය මුළු පිරිවැය වන්නේ

$TC=\frac{1}{2}Q^3 - 5Q^2 + 28Q + 10$

කෙටි කාලීනව සමාගම නිෂ්පාදනය නැවැත්විය යුත්තේ කුමන මිලකදීදැයි තීරණය කරන්න.

(ලකුණු 03)

05.

I. උපේක්ෂා වක්‍ර සිතියමක ප්‍රධාන ගුණාංග හතරක් නම් කරන්න.

(ලකුණු 04)

II. පෙට්‍රල් මිල ඉහළ යාමක ආදේශන ප්‍රතිවිපාකය හා ආදායම් ප්‍රතිවිපාකය අවශ්‍ය රූපසටහන් යොදාගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

III. "ඉහළ වැටුපක පරිභෝජනයට සාපේක්ෂව විවේකය මිල අධික වන බැවින් ධනාත්මක බෑවුම් සහිත ශ්‍රම සැපයුම් වක්‍රයක් පැන නගී". ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 05)

6.

I. ප්‍රමුඛ උපාය මාර්ගවල (Dominant strategies) සමතුලිතතාවයක් යනු කුමක් ද?

(ලකුණු 04)

II. නැෂ් සමතුලිතතාවක් (A Nash Equilibrium) පවතින බව ඔබ පැහැදිලි කරන්නේ කෙසේ ද?

(ලකුණු 04)

III. "ස්වයං උනන්දුව පිළිබඳ තර්කනය එක් එක් පුද්ගලයාට වඩා නරක වන සහයෝගී නොවන ප්‍රතිඵලයක් කරා ක්‍රීඩාවෙහි සහභාගිවන්නන් මෙහෙයවයි". සිරකරුගේ උභතෝකෝටිකය පිළිබඳ ඔබේ දැනුම මත පදනම්ව, ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 07)

@@@@@@@@@@@@@